වැලිකන්ද ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019ජූනි 29 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 16 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ කසල බඳු ආදායම තුළ 2017 වර්ෂයට අදාල හිඟ කසල බදු ආදායම රු. 200,900 ක් ඇතුලත්ව තිබුණි. | 2018 ආදායමින් ඉවත්කර සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී වර්ෂයට අදාළ ආදායම් පමණක් ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2018 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව බිල්කල උසාවි දඩ ආදායම හා 2018 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම හා මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී එම මුදල් ප්‍රමාණය සටහන් කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදායම් ශීර්ෂ 06 කට අදාළව හිඟ ආදායම් වාර්තා (ප්‍රා.ස.7) හා 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් හිඟ ශේෂ අතර රු.44,537,559 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ වෙනස්කම් සසදා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් ශීර්ෂ වෙන් කිරීමේදී සංකේත අංක වෙනස්වීම හේතුවෙන් එම ශේෂයන් අතර වෙනසක් පැවතුණි. |

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.366,761,372 ක් වූ ගිණුම් විෂයයන් 6 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අයිතිය තහවුරු කිරීම පිළිබඳ නිරවුල් තොරතුරු සභාව සතුව නොමැති බව පිළිගන්නා අතර,ඉදිරියේදී විධිමත් ආකාරයට කටයුතු කිරීමටපියවර ගත් බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසානයට වසර 03 සිට 17 කට වැඩි කාලයක සිට අයනොවී පවතින ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක එකතුව රු. 493,615 ක් විය. | හිග මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වියදම් ණයහිමි ශේෂ 04 කට අදාල එකතුව රු. 468,474 ක් වූ අතර ඒවා 2005 වර්ෂයේ සිට නිරවුල් නොකර පැවතුණි. | ණය ශේෂවල නිවැරදිභාවය තහවුරු කරගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මේ පිළිබඳව සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | 2006 හා 2007 වසරවල ගෙවිය යුතු සේවක ණය පොලී වශයෙන් සඳහන් රු. 32,049 ක මුදල හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිභාවය තහවුරු කරගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මේ පිළිබඳව සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ. 756 හා 757 | සමාලෝචිත වර්ෂය හා පූර්ව වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ නියමිත පරිදිසිදුකළ යුතුවේ. | 2017 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2/2018 හා 2018/12/8 දිනැති චක්‍රලේඛයේ 02(viii) වගන්තිය | මුදල් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන සියළුම නිලධාරීන් ගෙන් ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇපතැන්පත් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඇප ආඥාපනතට අනුව ඇප ගැනීමට කටයුතු කරමි. |

1.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2013 වර්ෂයට අදාලභාණ්ඩ සමීක්ෂණයේදී පුස්තකාල පොත් 598 ක් අපහරණ මණ්ඩලයක් පත් නොකොට අනුමැතියකින් තොරව සමීක්ෂණය සිදුකල නිලධාරියා විසින්ම විනාශ කර තිබුණි. | සමීක්ෂණ මණ්ඩල නිර්දේශය මත අපහරණ මණ්ඩලයක් මගින් අපහරණ කටයුතු සිදුකළ යුතුවේ. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ලිපිගොනු පරීක්ෂා කර ඉදිරියේදී අදාළ කටයුතු සිදු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍යප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,346,930 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.770,804 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම, රැස්කල ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ. 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ. 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 493,600 | 392,600 | 191,700 | 200,900 | 909,600 | 365,000 | 365,000 | - |
| කුලී බදු | 4,922,946 | 1,930,640 | 1,794,504 | 2,698,150 | 5,667,900 | 4,495,116 | 2,823,900 | 2,562,014 |
| බලපත්‍ර ගාස්තු | 1,338,750 | 2,759,810 | 2,759,810 | 651,475 | 1,067,500 | 326,720 | 330,045 | 651,475 |
| වෙනත් ආදායම් | 38,771,388 | 37,360,067 | 32,814,087 | 16,484,695 | 30,639,400 | 5,053,617 | 17,610,917 | 11,938,714 |
| එකතුව | 45,526,684 | 42,443,118 | 37,560,101 | 20,035,220 | 38,284,400 | 10,240,453 | 21,129,862 | 15,152,204 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.45,526,685 ක් වූ නමුත්, ඉන් බිල්කල ආදායම රු.42,443,118 ක් වූයෙන් රු.3,083,567 ක අධි ඇස්තමේන්තුවක් පැවතුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.20,035,221 ක් වී තිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු සැකසීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| | | |
| --- | --- | --- |
| වරිපනම් හා බදු සහ බදුකුලී ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 39ක හා සියයට 36 ක පහල අගයක පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුවේ. | මේ වන විට සමීක්ෂණයක් මඟින් සියළු ව්‍යාපාරික ස්ථාන හඳුනාගෙන ආදායම් රැස්කිරීමට කටයුතු කරමි. |

2.2.4 කුලී

-----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | -------------- |
| (අ) | 2001/2002 වසර වල කටුවන්විල මස්කඩය හා වැලිකන්ද සතිපොළ මඟින් අයවිය යුතු රු. 208,875 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2007 හා 2008 කාලය තුළ පුද්ගලයින් 07 දෙනෙකු සඳහා බදු දී තිබූ මස්කඩ හා සතිපොළවල් මඟින් අයවිය යුතු රු. 401,693 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | සෙවනපිටිය කඩ කාමර 31 ක හිඟ කඩ කුලී ආදායම 2018 දෙසැම්බර් 31 දිනට රු. 2,080,583 ක් වූ අතර ඉන් වසර 1 -2 කට අධික කාලයක් කඩ කුලී නොගෙවා ඇති කඩ හිමියන් 23 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රු. 1,511,632 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය පියවර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | වැලිකන්ද සතිපොළ බදුදීම යටතේ ටෙන්ඩර් මුදලින් ඉතිරි සියයට 50 ක මුදල වූ රු. 805,750 ක් 2017 ජූනි 30 ට පෙර සභාවට ගෙවිය යුතු වුවත්, 2018 දෙසැම්බර් 31 වන විටත් එම හිඟ මුදල හා දඩ මුදල වූ රු.117,313 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.5 බලපත්‍ර ගාස්තු

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ---------- | -------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොවිපලවල් 19 ක් ඇති බව හඳුනාගෙන ඇතත්, 2018 වර්ෂයට බලපත්‍ර ගාස්තු අයකර තිබූ ගොවිපල සංඛ්‍යාව 04 කට සීමා වී තිබුණි. | බලප්‍රදේශයේ සියලුම ගොවිපලවල් මඟින් බලපත්‍ර ගාස්තු අයකළ යුතුවේ. | 2019 ට සමීක්ෂණයක් සිදුකර ඇති අතර එම ස්ථාන වලින් මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛනයේ සඳහන් ආයතන 512 කින් ගාස්තු අයකර ඇති ආයතන/ වෙළඳසැල් සංඛ්‍යාව 165 කට සීමාවී තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු කිසිවක් අනාවරණය කර නොතිබුණි. | බල ප්‍රදේශයේ සියලුම වෙළඳසැල් මගින් බලපත්‍ර ගාස්තු අයකළ යුතුවේ. | 2019 ට සමීක්ෂණයක් සිදුකර ඇති අතර එම ස්ථාන වලින් මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 ජූලි 31 දක්වා ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.9,082,143 ක් 2019 අප්‍රේල් වන විටත් අයවී නොතිබුණි. | සියලු උසාවි දඩ ගාස්තු හඳුනාගෙන සභාව වෙත ලබාගැනීමට පියවර ගත යුතුවේ. | ඉතිරි මුදල් ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. |

2.2.7 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රුහුණු ජල ව්‍යාපෘතියේ2017 වර්ෂයේ ජල පාරිභෝගියන් 741 දෙනෙකුගෙන් හා 2018 දෙසැම්බර් 31 දිනට ජල පාරිභෝගියන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟහිටි ජල ගාස්තුව රු. 5,915,070 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුවේ. | මේ වන විට ජල ගාස්තු අයකරමින් පවතින බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතාසේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේකාර්යයන් 10 ක් සඳහා සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා එම කටයුතු නියාමනය කර ගාස්තු අයකළ යුතුවේ. | 2019 ජනවාරි 11 දින ගැසට් පත්‍රය මගින් පනවා ගෙන ඇති බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| | | |
|---|---|---|
| පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2014 අනුව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වර්ෂය තුළ ක්‍රියාත්මකකිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසිය යුතුවේ. | 2019 වර්ෂය සඳහා සකස්කර ඇති බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. | සභාවේ අරමුණු හඳුනාගත යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) | අයවැය සකස් කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජුලි 31 දිනැති අංක BD/CBD/4/1/2-2018 චක්‍රලේඛයෙන් හඳුන්වා දී තිබුණු දර්ශක සඳහා දත්ත එක්රැස් | උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර |

| | | | |
|---|---|---|---|
| | කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. | | ඉදිරියේදී කටයුතු කරමි. |
| (iii) | ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා වූ සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබූ බැවින් දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | දත්ත එක්රැස් කිරීමට කටයුතු කළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| (iv) | 2016, 2017 හා 2018 වර්ෂවල තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| (v) | ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් නොපැවති අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | පුහුණු කටයුතු නිසි පරිදි සිදුකළ යුතුවේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | --------------------- | ---------- | -------------- |
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන රථ වාහන 03 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | සභාව සතු වාහන පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 සිට 2018 දක්වා කාලය තුළ පුස්තකාල සාමාජිකයන් වෙත බැහැරට රැගෙනයාම සඳහා ලබාදී ඇති පුස්තකාල පොත් 172 ක් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | පොත් 172 ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම පොත් ආපසු පුස්තකාලය වෙත ලබාගැනීමට අදාළ ලිපි සාමාජිකයන් වෙත යැවීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු රු. 307,738,611 ක් වූ අයිතිම 47 කින් යුතු ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය සභාව සතුව නොපැවතුණි. | අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙම ඉඩම් පවරා ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | | කරමි. |
| (ඈ) | මහජන උපයෝගිතාවයන් සඳහා දිවි නැගුම දෙපාර්තමේන්තුවෙන්2014 වර්ෂයේදී සභාවට ලබාදී තිබුණු ගැල්වනයිස් කොඩිකණු 368 න් එවකට සභාවේ සභිකයින් රැගෙන ගොස් තිබූ කොඩිකණු 213 ඇතුළුව 2018 වර්ෂය අවසාන වන විට අස්ථානගත වී තිබූ රු. 283,428 ක් වටිනා කොඩිකණු 256 ක් සභාව වෙත නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොඩි කණු 256 සභාව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඒවා ලබා දීමට කටයුතු සිදුකරන ලෙස සභා වාරයේදී දැනුම් දී ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තෘතියික මට්ටමට අයත් ලේකම් තනතුර, ද්විතියික මට්ටමට අයත් වැඩ සටහන් සහකාර තනතුරු 06 ක්, කළමනාකාර සහකාර තනතුරු එකක්, තාක්ෂණ නිලධාරි තනතුරු එකක් හා ආදායම් පරික්ෂක තනතුරු එකක් වසර ගණනාවක සිට පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු තනතුරු සඳහා නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරදෙන ලෙස පළාත් පාලන කොමසාරිස්ගෙන් ලිඛිතව ඉල්ලා ඇති බව දන්වමි. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලයට අමතරව ආදේශක, අනියම් තාවකාලික පදනම මත සෞඛ්‍ය කම්කරු තනතුරු දෙකක්, මනු කියවන්නා තනතුරු දෙකක්, මුරකරු තනතුරු 03 ක් හා රියදුරු තනතුරක් සඳහා බඳවාගෙන තිබූ අතර මෙම තනතුරුවල අවශ්‍යතාවය අනුව අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තනතුරු වල අවශ්‍යතාවය සලකා අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් කර ගත යුතුවේ. | පිළිතුරු දී නැත. |
| (ඇ) | ස්ථිර නිලධාරීන් බඳවා නොගෙන සභාවේ සරප් තනතුර සඳහා මාර්ග කම්කරු නිලධාරිනියක් ද, ආදායම් පරික්ෂක තනතුර සඳහා ජල පොම්ප ක්‍රියාකරුවකුද සේවයේ යොදවා තිබුණි. | අදාළ තනතුර සඳහා අනුමත පුද්ගලයින් බඳවාගත යුතුවේ. | නිළධාරි පුරප්පාඩු නිසා ඒ අනුව සේවයේ යෙදවීමට සිදුවී ඇත. |
| (ඈ) | 2013/ 2014 හා 2015 මැයි දක්වා කාලය තුළ ස්ථානමාරු වී ගිය නිලධාරීන් 05 කුගෙන් අයවිය යුතු රු.127,035 ක ණය ශේෂය අයකර ගැනීම කෙරේ සභාව ප්‍රමාණවත් අවධානය යොමුකර නොතිබුණි. | හිග ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඉ) | ස්ථානමාරු වී ගොස් සිටි නිලධාරීන් 04 දෙනෙකු මේ වන විට වැඩ තහනම් වීම හා මියයාම නිසා ඔවුන්ගෙන් අයවිය යුතු රු. 326,913 ක් වටිනා ණය ශේෂ අයකර ගැනීමට නොහැකි වී | ණයකරුගෙන් හෝ ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කළ | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. | යුතුවේ. | |

3.4 වත්කම් කළමනාකරණය

-------------------------

නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | 2008 හා 2009 වර්ෂවල උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මඟින් සභාව වෙත ලබාදී තිබුණු රු.613,500 ක් වටිනා සහල්පිටි ආශ්‍රිත නිෂ්පාදන උපකරණ කට්ටලය වසර 09 කට අධික කාලයක සිට උපයෝජනය නොකර දිරාපත් වෙමින් පැවතුණි. | වත්කමින් ප්‍රයෝජනය ගත හැකි වෙනත් රාජ්‍ය ආයතනයකට හෝ වෙනත් කාර්යකට පැවරීම.භාවිතයට ගත නොහැකි නම් අපහරණයට කටයුතු කළ යුතුවේ. | ඒ සම්බන්ධයෙන් නුදුරේදීම කටයුතු කරමි. |

3.5 හඳුනාගත් පාඩු

----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් සෙවනපිටිය කඩ කාමරවල හිඟ මුදල් සම්බන්ධයෙන් වැඩ බලන ක්ෂේත්‍ර පරීක්ෂක වරයෙකු විසින් 2015 හා 2016 වර්ෂවලදී රු.460,600 කට ආසන්න මුදලක් වංචා කිරීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මූල්‍ය අවභාවිතය සම්බන්ධ පරීක්ෂණ කඩිනමින්සිදු කළ යුතුවේ. | මෙතෙක් මූලික විමර්ෂණයක් සිදුකර නොමැති බව දන්වමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් පරිදි පරිග්‍රහන ලේඛනය අනුව පුස්තකාල පොත් 479 ක ඌණතාවයක් ඇති බව හඳුනාගෙන ඇති නමුත් ඒ සම්බන්ධයෙන් ඊට වගකිව යුතු නිලධාරීන් පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක්2019 අප්‍රේල් 10 වන විටත් ගෙන නොතිබුණි. | සභාවේ දේපල ඌනතා සම්බන්ධ පරීක්ෂණ කඩිනමින් සිදුකළ යුතුවේ. | ඉදිරියේදී ඒ පිළිබඳව කටයුතු කිරීමට පියවර ගන්නා බව දන්වමි. |

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේදී ඉටුකලඅන්තර්බන්ධිත ගල් (Interlock) අතුරා සකසන ලද මාර්ග දෙකක පැති බැම් (Curb wall) සඳහා රු.121,130 ක්වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුවේ. | අදාළ මුදල අඩුකරගෙන ගෙවීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ගනුදෙනු සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන පරික්ෂාවක් සිදුකිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | සියලුම කාර්යයන් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේදී අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරන බව දන්වමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක NCP/CS/01 විගණන හා 2016 මැයි 11 දිනැති ලිපිය මඟින් විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 02 කට වරක් පැවැත්විය යුතු බව දක්වා තිබුණ ද, 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු එකක් පමණක් පවත්වා තිබුණි. | මාස 02කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | ඉදිරියේදී විගණන හා කළමනාකරණ කමිටු නිසිලෙස පැවැත්වීමට කටයුතු කරමි. |